# මහාචාර්ය ඒ. ඩී. පී. කලන්සූරිය මහතා

ඩී.ඩී.සේනාධීර

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් දීර්ඝ කාලයක් අගනා සේවාවක් ඉටුකළ මහාචාර්ය ඒ. ඩී. පී. කලන්සූරිය මහතා පසුගිය දා අභාවප්‍රාප්ත විය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශනය පිළිබඳ මහාචාර්යවරයෙකු වශයෙන් වර්තමාන ශ්‍රී ලාංකේය ශාස්ත්‍රීය ප්‍රජාව අතර කීර්තිමත් විද්වතෙකු වූ ඒ මහතා නූතන තරුණ විද්‍යාර්ථීන් අතර බෙහෙවින් ම ජනප්‍රියත්වයට පත්වූයේ බටහිර දර්ශනය සිංහල භාෂා මාධ්‍යයෙන් හැදෑරවීමට ගත් බලවත් ප්‍රයත්නය නිසාය.

1963 දී දර්ශනය පිළිබඳ ගෞරව උපාධිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් දිනාගත් කලන්සූරිය මහතා සහාය කථිකාචාර්යවරයෙකු වශයෙන් 1964 දී සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. ඉන් අනතුරුව එතුමා කථිකාචාර්යවරයෙකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු, මහාචාර්යවරයෙකු ලෙස මෙන් ම ශාස්ත්‍රපීඨාධිපතිවරයෙකු වශයෙන් ද එම සරසවියෙහි සේවයේ නිරත විය. පසුකල දකුණු කොරියාවේ සෝල් විශ්වවිද්‍යාලයේ දර්ශනය පිළිබඳ ආරාධිත මහාචාර්යවරයකු ලෙස ද ඉන්දියාවේ ජවහල්ලාල් නේරු විශ්වවිද්‍යාලයේ දර්ශන අංශයේ මහාචාර්යවරයෙකු ලෙස ද කටයුතු කරමින් අඩ සියවසකට ආසන්න කාලයක් සිස්සේ ශාස්ත්‍රීය ලෝකය පෝෂණය කරණු පිණිස සිය දායකත්වය නොමඳව ලබා දුන්නේය.